# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 මැයි මස 13 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.05.20 දින නිකුත් කරන ලදී)**


# වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන)

**1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ 2 වන වගන්තිය, එහි (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වධදීමේ වරදට අදාළ දඩය ඉහළ දැමීම මඟින් සංශෝධනය කෙරේ.

## වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන)

එල්. ඩී.— ඕ. 3/2021

**1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත සංශෝධන කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2021 අංක  දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1994 අංක 22 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව